INTERNATIONAL TRUTH AND JUSTICE PROJECT

W ITJPSL.COM
E ITJPSL@GMAIL.COM

EXECUTIVE DIRECTOR:
YASMIN SOOKA

**2017 මාර්තු 31**

## මාධ්‍ය නිවේදනය: හමුද පරිපාලනයට යුද අපරාධ චුදිතයකු පත් කිරීමෙන් ශ්‍රී ලංකාව එක්සත් ජාතීන්ට දුන් පොරොන්දු වලට ගරහයි

යුද අපරාධ සම්බන්ධයෙන් චෝදනා ලබන මේජර් ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ශ්‍රී ලංකා යුද හමුදවේ ප්‍රධාන පරිපාලන නිලධාරියා ලෙස පත් කිරීම යුද්ධය අවසන් වී අට අවුරුද්දක් තිස්සේ තවමත් යුක්තිය අපේක්ෂාවෙන් බලා සිටින දස දහස් සංඛ්‍යාත යුද පීඩිතයන්ට එල්ල කළ අතුල් පහරකි.

මේජර් ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා යුද හමුදවේ විධායක ජනරාල් ධුරයට පත් කරන ලද බව ශ්‍රී ලංකා යුද හමුදව විසින් මාර්තු 30 බ්‍රහස්පතින්ද ප්‍රකාශයට පත් කරන ලදී[1].

"ජිනීවාහි මානව හිමිකම් මණ්ඩලය අවසන් වී දින කීපයක් යත්ම මේ පත්වීම සිදු කිරීම සාහසික ක්‍රියාවක් වන අතර ආණ්ඩුව වගවීම හෝ ආරක්ෂක අංශ ප්‍රතිසංස්කරණ හෝ බරපතල කොට නොසලකන බව මේ පත්වීමෙන් පෙන්නුම් කෙරෙයි," යනුවෙන් දකුණු අප්‍රිකාවේ ජොහැන්නස්බර්ග් නුවර සිට නිවේදනයක් නිකුත් කරන සත්‍යය හා යුක්තිය සඳහා වන ජාත්‍යන්තර ව්‍යාපෘතියේ (I TJP) විධායක අධ්‍යක්ෂිකා යැස්මින් සූකා පවසයි. "මේ පුද්ගලයා අඩුම වශයෙන් ජාත්‍යන්තර අපරාධ සම්බන්ධයෙන් පිළිතුරු දීමේ වගකීමෙන් බැඳෙන අයකු බව එක්සත් ජාතීන්ගේ හිටපු මහ කොමසාරිස්වරිය නවී පිල්ලේ පවසා තිබුනි,"[2] යි ඇය වැඩි දුරටත් කියා සිටියාය.

නිලතල වලට පත් කරනු ලබන රජයේ සහ ආරක්ෂක අංශ වල නිලධාරීන් පූර්ව සෝදිසියකට භාජන කරන බව  ජිනීවාහිදී සම්මත කරගන්නා ලද ශ්‍රී ලංකා ආණ්ඩුව හවුල් වූ එක්සත් ජාතීන්ගේ යෝජනා දෙකින්ම එකඟ වී තිබේ.

"මෙය වින්දිතයන් ට පමණක් නොව, පූර්ව සෝදිසි වැඩ පිළිවෙලක් දියත් කරන බවට ශ්‍රී ලංකා රජය පොරොන්දු වූ ජාත්‍යන්තර ප්‍රජාවටත් කරන ලද අවමානයකි," යි යැස්මින් සූකා පවසන්නීය. "අපරාධකරුවන් බවට චෝදනා ලබන පුද්ගලයන්ට දිගටම වරදන දෙන ආණ්ඩුවක් විදේශ වලට

1 New AG Assumes Duties, 30 MARCH 2017, army website, http://army.lk/news/new-ag-assumes-duties-0
2 http://www.southernafricalitigationcentre.org/1/wp-content/uploads/2012/12/SALC-Briefing-Paper-ShavendraSilva-Sri-Lanka-061212.pdf පාදක සටහන 21 හි දැක්වේ.

නිලධාරීන් යවන විට යුද අපරාධ හා සම්බන්ධ වීමේ චෝදනා සම්බන්ධයෙන් පූර්ව සෝදිසියක් කිරීම පිළිබඳව පැහැදිලිවම විශ්වාසයක් තැබිය නොහැකි නිසා එක්සත් ජාතීන් විසින් කළ යුත්තේ ශ්‍රී ලංකාවෙන් එවන සාම සාධක හමුදා භට පිරිස් යොදා ගැනීම අත් හිටුවීමයි."

**පසුබිම**

ශ්‍රී ලංකාවේ සිවිල් යුද්ධයේ අවසාන අදියරේදී කුප්‍රකට 58 වැනි සේනාංකයේ ආඥාපති වූයේ මේජර් ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ය[3].

· 2009 දී පුදුමාතලන් රෝහලට ෂෙල් වෙඩි ගැසූ බලඇණි අතරින් එකක් ලෙස පිළිගත හැකි සාධාරණ සාක්ෂි එක්සත් ජාතීන්ගේ ස්වාධීන පරීක්ෂණයක් වෙත ලැබී තිබුනි. මේ තාවකාලික රෝහලේ පිහිටීමේ GPS චන්ද්‍රිකා දත්ත යුද හමුදවට ලබා දී තිබුනු අතර, කලපුවෙන් එහා පැත්තේ කඳවුරු ලා සිටි 58 වැනි සේනාංකයට එතැන පියවි ඇසින් දැක ගැනීමේ හැකියාවක් තිබුනි[4]. තුවාලකරුවන්ගෙන් පිරී ඉතිරී යමින් තිබූ රෝහල නිරන්තර ෂෙල් ප්‍රහාරයට ලක්වූ බව දිවි ගලවාගත් අය පවසා තිබේ. කෙසේ වෙතත්, මේජර් ජෙනරාල් සිල්වා කියා තිබුනේ එල්ටීටීඊ කැරලිකරුවන්ට ප්‍රතිකාර කිරීම සඳහා යොදගනු ලැබූ රෝහලේ  කිසිදු සාමාන්‍ය වැසියකු නොසිටි බවයි.

එසේ වෙතත්, තුවාල ලද හා සටන් කළ නොහැකි සටන්කරුවන් ප්‍රහාරයට ඉලක්ක කර ගැනීම ජාත්‍යන්තර මානවීය නීතිය යටතේ යුද අපරාධයක් වෙයි.

· 2009 අප්‍රේල් මාසයේ පුදුමාතලන් නැවත අල්ලාගැනීමට දියත් කළ යුද ප්‍රහාරයට නායකත්වය දුන්නේ තමන් බව ද මේජර් ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා පිළිගෙන තිබේ[5]. මෙහිදී විශාල ජීවිත හානියක් සිදුවූ බව දිවි ගලවාගත් අය පවසති.  තමන් ඩ්‍රෝන් දර්ශන වල ආධාරයද  ලබාගත් බව මේජර් ජෙනරාල් සිල්වා කියයි. මෙයින් වැටහෙන්නේ ප්‍රහාරය දියත් වන අවස්ථාවේ සාමාන්‍ය වැසියන් අති විශාල සංඛ්‍යාවක් සිටි බවත් ඔවුන් තුවාල වීමටත් මිය යාමටත් හැකි බව කල් තියාම දැන සිටීමේ පහසුකම් තිබුනු බවය[6].

· එක්සත් ජාතීන්ගේ සංවිධානය පවසන ආකාරයට, එල්ටීටීඊ යේ හමුද හා දේශපාලන නායකයන් 2009 මැයි 18 ද භාරවූ අවස්ථාවේ මේජර් ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා එම ප්‍රදේශයේ ඉඳ ඇත. ඒ සිය ගණනක් පසුව හිතුමතේ ඝාතනය කර දමන ලදී. නැතහොත් බලහත්කාරයෙන් අතුරුදහන් කර දමන ලදී[7]. සාක්ෂිකරුවන් විසින් ඇසින් දුටු හමුද අත් අඩංගුවේ සිට පසුව අතුරුදහන් වූ අයගේ ලැයිස්තුවක් I TJP විසින් 2014 දී සම්පාදනය කරන ලදී. එල්ටීටීඊ කාඩර්වරුන් සමග බස් රථ වලට නංවන ලද කාන්තාවන් සහ ළමුන් ද ඒ ලැයිස්තුවේ වෙයි[8].

· "සුදු කොඩි" භාරවීම් සිදුවූ 2009 මැයි 18ද උදෑසන ශවේන්ද්‍ර සිල්වා එතැන සිටි බවටත් චෝදනා නැගී ඇති අතර ඒ පළාතේ හමුද විධානය පැවතියේ තමන් යටතේ බව ඔහු විසින් පිළිගෙන තිබේ. "සුදු කොඩි" සිදුවීම සම්බන්ධයෙන් I TJP විසින් 2014 සම්පාදනය කරන ලද වාර්තාවක එන ඇසින් දුටු සාක්ෂිකරුවකු පවසා ඇත්තේ භාරවූ එල්ටීටීඊ දේශපාලන අංශයේ නායකයන් ට ශවේන්ද්‍ර සිල්වා අතට අත දෙනු ඔහු දුටු බවයි[9]. ඔවුන්ගේ මළ සිරුරු එයින් පැය කිහිපයකට පසු මහමග තිබී හමුවිය. එක්සත් ජාතීන්ගේ පරීක්ෂණය කියා සිටියේ අන්තරායකින් තොරව භාරවිය හැකි බවට ආණ්ඩුවෙන් සහතිකයක් දී තිබියදීත්, ඒ නායකයන් නඩු නො අසාම ඝාතනය කර ඇති බවයි[10].

---

[3] Para 116, OHCHR INVESTIGATION INTO SRI LANKA (OISL), SEPTEMBER 2015,A/HRC/30/CRP.2 .
[4] OISL Para 840
[5] OISL Para 846
[6] OISL Para 851
[7] OISL Para 287
[8] http://tamildiplomat.com/itjp-releases-list-of-those-who-have-disappeared-and-seen-surrendering-to-thesla-on-18-may-2009-2/
[9] ITJP SITE: www.white-flags.org
[10] මළ සිරුරු පිළිබඳ ඡායාරූප වල වෝහාරික පරීක්ෂණයකින් ඇඟවෙන්නේ පසුපසට අත් බැඳ සිටියදී කිහිප වතාවක් හිසේ පසුපසට වෙඩි තබා ඇති බවයි.

58 සේනාංකය වධහිංසා පැමිණවීම සම්බන්ධයෙන්ද චෝදනා ලබන බව එක්සත් ජාතීන්ගේ සංවිධානය වැඩි දුරටත් පවසයි[11].

යුද්ධයෙන් පසු, ශවේන්ද්‍ර සිල්වාට දඬුවමින් බේරී යා හැකි රාජ්‍යතාන්ත්‍රික මුක්තිය සලසා දෙමින් ඔහු එක්සත් ජාතීන්ගේ නියෝජ්‍ය නියෝජිත ලෙස නිව් යෝර්ක් නුවරට යවන ලදී. යුද අපරාධ සහ මානව වර්ගයාට එරෙහි අපරාධ සම්බන්ධයෙන් මේජර් ජෙනරාල් වරයාට එරෙහි චෝදනා නිසා ඔහු සාමසාධනය සම්බන්ධ එක්සත් ජාතීන්ගේ ඉහලම උපදේශක මණ්ඩලයකින් 2012 දී ඉවත් කරන ලදී[12]. ඉන් අනතුරුව ඔහු දකුණු අප්‍රිකාවේ තානාපති ධුරයකට පත් කර යැවීම වලක්වනු ලැබුවේ ඔහු යුද අපරාධ හා මානව වර්ගයාට එරෙහි අපරාධ වලට සම්බන්ධ බවට බරපතල චෝදනා ගණනාවක් ඇති හෙයින් ඔහු ඊට නොගැලපෙන බවට රාජ්‍ය නොවන සංවිධාන විසින් නෛතික උපදෙස් ලබා දී දකුණු අප්‍රිකාව ඔහු භාරගැනීම ප්‍රතික්ෂේප කිරීමට බල කරනු ලැබීමෙනි[13].



**ඡායාරූපය**

මියගිය එල්ටීටීඊ අයගේ සිරුරු වලට අත දිගු කරන්නේ **ශවේන්ද්‍ර සිල්වා** ය. ඔහුගේ එක පසකින් සිටින්නේ බ්‍රසීලය, පේරු, චිලී, ආජන්ටිනා, කොලොම්බියා සහ සුරිනාම් හි වර්තමාන තානාපති හා වධහිංසා සම්බන්ධයෙන් සහාය වූ බවට චෝදනා ලබන **ජගත් ජයසූරිය**[14] යි. අනික් පැත්තේ ඉන්නේ හිටපු ජර්මන් තානාපති මෙන්ම යුද අපරාධ වලට සම්බන්ධ බවට චෝදනා ලබන **ජගත් ඩයස්**[15] ය.

---

[11] OISL Para 544

[12] http://foreignpolicy.com/2012/02/17/human-rights-advocates-blast-appointment-of-sri-lankan-commander-topeacekeeping-panel/

[13] SOUTH AFRICA'S OBLIGATION TO REFUSE TO RECEIVE AND RECOGNISE SRI LANKAN GENERAL AND SUSPECTED WAR CRIMINAL SHAVENDRA SILVA AS SRI LANKA'S DEPUTY AMBASSADOR TO SOUTH AFRICA, Southern Africa Litigation Centre.

[14] http://www.itjpsl.com/assets/press/ITJP_joseph_camp_press_releases_ENG.pdf

[15] https://www.ecchr.eu/en/our_work/international-crimes-and-accountability/sri-lanka.html

INTERNATIONAL TRUTH AND JUSTICE PROJECT